# ඔබේ ව්‍යාපාරය ආරම්භ කරන්න(SYB)

ඔබ ඔබේම ව්‍යාපාරයක් ආරම්භ කිරීමට සූදානමින් සිටින්නෙක්ද? එසේ නම් ඔබේ සිතේ ඇති ගැටළුවලට විසඳුම අප සතුව ඇත. ඔබ නිශ්චිත ව්‍යාපාර අදහසක් ඇති පුද්ගලයෙකු නම් අපගේ "ඔබේ ව්‍යාපාරය ආරම්භ කරන්න" (SYB) වැඩසටහනට සම්බන්ධ වී විද්‍යානුකූලව ඔබගේ ව්‍යාපාර සැලැස්ම සකස්කරගන්නා ලෙස ආරාධනා කරමු.

මෙහිදී ඔබගේ ව්‍යාපාරයට අදාලව

- අලෙවි සැලැස්ම
- මූල්‍ය සැලැස්ම
- ව්‍යාපාරයේ වර්ගය හා නීතිමය තත්ත්වයන්
- අවශ්‍ය කාර්ය මණ්ඩලය
- අවශ්‍ය ආරම්භ ප්‍රාග්ධනය
- ආරම්භක ප්‍රාග්ධනය සපයාගන්න මාර්ග යන කරුණු



# නිවැරදි අධ්‍යනයකින් ආරම්භ කරනා ව්‍යාපාරයක් ඔබේ සාර්ථක දිවිමගේ ප්‍රවේශ දොරටුවයි

SIYB ශ්‍රී ලංකා සංගමය

ඔස්සේ ඔබේ ව්‍යාපාරය දියත් කිරීමට අවශ්‍ය සම්පූර්ණ සැලැස්ම සකස් කර ගැනීමේ හැකියාව ඔබට ලැබෙනු ඇත.

"හොඳ සැලැස්මකින් ආරම්භ කරන ව්‍යාපාරයකට ගමනාන්තයක් නැත"

ඔබේ ව්‍යාපාරයට අපගේ සුභ පැතුම් !!

වැඩි විස්තර/ලියා පදිංචිය සඳහා පහත දුරකථන අංක අමතන්න


+94-11-2827693
ceo@siybsrilanka.org
www.siybsrilanka.org


SIYB Sri Lanka
WE SET THE STANDARDS IN MANAGEMENT TRAINING

SIYB
START AND IMPROVE YOUR BUSINESS

# ව්‍යාපාර ගැන දැනගන්න (KAB)

ඔබ වෘත්තිය පුහුණුවක් හදාරන කෙනෙක් ද? පාසැල් හැර ගිය තරුණයෙක්/තරුණියක් ද? රැකියාවක් සොයමින් කල් ගත කරන අයෙක් ද? එසේත් නැති නම් ව්‍යාපාර ක්ෂේත්‍රයට ප්‍රථම පියවර තැබීමට බලා සිටින කෙනෙක් ද? ඒසේ නම් එන්න අපගේ "ව්‍යාපාර පිළිබඳව දැනගන්න (KAB) පුහුණු වැඩ සටහනකට සම්බන්ධ වන්න. මෙහිදී

- ව්‍යාපාරයක් යනු කුමක්ද?
- ව්‍යවසායකයෙකු යනු කව්ද?
- මම ව්‍යවසායකයෙක් වන්නේ කෙසේද?
- මම ව්‍යාපාරයක් සංවිධානය කරගන්නේ කෙසේද?
- මම ව්‍යාපාරයක් මෙහෙය වන්නේ කෙසේද?
- ව්‍යවසායකයෙකු වීමේ පියවර මොනවාද?

මෙම කරුණු අනුසාරයෙන් ව්‍යාපාර ලෝකය පිළිබඳව පුළුල් දැනුමක් ඇති සාර්ථක ව්‍යවසායකයෙකු වීමට ඔබට මග පෙන්වයි.

# ව්‍යාපාරයට මග (WTB)

ඔබ රැකියාවක් සොයමින් පසුතැවෙන තරුණයෙක්/තරුණියක්ද? ඔබ ඔබේ අණාගත පැවැත්ම ගැන තීරණයක් ගැනීමට සැලසුම් කරමින් සිඳින අයෙක්ද? ඔබ පාසැල් හැර ගිය තරුණයෙක්/තරුණියක්ද? ඔබ ව්‍යාපාර ක්ෂේත්‍රයට යොමුවීමට උනන්දුවෙන් සිටින අයෙක්ද? එසේ නම් ඔබේ ගැටළුවලට විසඳුම අපෙන්. අපගේ "ව්‍යාපාරයට මග" (Way to Business) වැඩ සටහනට සම්බන්ධ වී

- ව්‍යාපාරිකයෙක් යනු කව්ද?
- ව්‍යාපාරයක් යනු කුමක්ද?
- ව්‍යාපාරයකට යොමුවීමෙන් අත්කරගත හැකි වාසි මොනවාද?

යන කරුණු අධ්‍යනය කිරීම ඔස්සේ ව්‍යාපාර ක්ෂේත්‍ර තුලින් ඔබගේ ජීවිතය ජයගැනීමට හැකි මාර්ගය හඳුනාගන්න.

# ඔබේ ව්‍යාපාර අදහස ඇති කරගන්න (GYB)

ඔබ ඔබටම ගැලපෙන ව්‍යාපාරය කුමක් දැයි හඳුනාගැනීමට නොඉවසිල්ලෙන් සිටින්නෙක්ද? එසේ නම් අපගේ "ඔබේ ව්‍යාපාර අදහස් ඇතිකරගන්න" වැඩ සටහනට සම්බන්ධ වී ඔබටම ගැලපෙන ව්‍යාපාරය කුමක්දැයි විද්‍යානුකූල අධ්‍යනයක් තුලින් හඳුනාගන්න. මෙහිදී

- හොඳ ව්‍යාපාර අදහසක් යනු කුමක්ද?
- ඔබ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට සුදුසු පුද්ගලයෙක්ද?
- ඔබේම ව්‍යාපාර අදහස් ජනිත කරගන්නේ කෙසේද?
- මේවා විශ්ලේෂණය තුලින් ඔබට වඩාත් ගැලපෙන ව්‍යාපාරය හඳුනා ගන්නේ කෙසේද?

යන කරුණු අධ්‍යනය කිරීමෙන් ඔබේ ඉලක්කය සපුරා ගත හැකිය. මෙලෙස නිවැරදි ව හඳුනාගත් ව්‍යාපාර අදහසකින් පටන් ගන්නා ව්‍යාපාරයක් ඉතාමත් සාර්ථකව හා තිරසාරව ඉදිරියට වර්ධනය වන බවට දත්ත මගින් තහවුරු කර ඇත.

"ඔබේ ව්‍යාපාර අදහස ජනිත කරගන්න" වැඩසටහනකට සම්බන්ධ වී ඔබත් සාර්ථක ව්‍යාපාරිකයෙකු වීමට ප්‍රථම පියවර තබන්න.